සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව</u>**

**<u>மேல் மாகாண அரசாங்க சேவை ஆணைக்குழு / Provincial Public Service Commission (WP)</u>**

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022</u>**

| මිනිත්තු 30 | රජයේ කාර්යාලවල භාවිත වන ගිණුම් ක්‍රම | විභාග අංකය | |
|---|---|---|---|

- ❖ පිළිතුරු ලිවීමට පෙර ලබා දී ඇති උපදෙස් හොඳින් කියවන්න.
- ❖ විභාග අංකය ඉහත කොටුවේ හා පිළිතුරු ලියන සෑම පිටුවකම දෙපසම ඉතා පැහැදිලිව ලියන්න.
- ❖ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. <u>පැන්සල් භාවිච්චි නොකරන්න.</u>
- ❖ ලබාදී ඇති උපදෙස්වලට අනුකූල නොවන පිළිතුරු ඇගයීම් කාර්යය සඳහා සලකා ගනු නොලැබේ.

**I කොටස　　　　කාලය මිනිත්තු 30කි. ලකුණු 25 යි**

**අංක 01 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ හතර අතුරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා <u>ඊට අදාළ අංකය</u>, ප්‍රශ්නය ඉදිරියේ ඇති <u>තිත් ඉර මත</u> ලියන්න.**

1.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සතු අරමුදල්වලින් ප්‍රධාන අරමුදල ඒකාබද්ධ අරමුදල වේ.එම අරමුදල සම්බන්ධව වඩාත් ගැලපෙන වැකිය වනුයේ,

(1) භාණ්ඩාගාරය සතුව ඇති සියලු මුදල් පවතින අරමුදල වේ.

(2) රජයට අයත් සියලු මුදල් පවතින අරමුදල වේ.

(3) සියලු අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු,සංස්ථා සහ මණ්ඩල සතුව ඇති මුදල් පවතින අරමුදල වේ.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 වන ව්‍යවස්ථාව අනුව පිහිටුවා ඇති අරමුදල වේ. **(............)**

2. “පරිපූරක ඇස්තමේන්තුවක්” පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීමෙන් සමස්ත අයවැය ප්‍රතිපාදනය

(1) වෙනස් නොවේ.

(2) වැඩි වේ.

(3) අඩු වේ.

(4) ඉහත කරුණු තුනම සිදුවිය හැක. **(............)**

www.psc.wp.gov.lk

3.ප්‍රසම්පාදන පටිපාටිය යටතේ ලංසු ප්‍රදානය කිරීමට පෙර ලබා ගන්නා සුරක්ෂණයක් වනුයේ,

(1) කාර්ය සාධන සුරක්ෂණය.

(2) අත්තිකාරම් ගෙවීම් සුරක්ෂණය

(3) ලංසු සුරක්ෂණය

(4) රඳවා ගත් මුදල් ආපසු ගෙවීම් සුරක්ෂණය (............)

4. පහත සඳහන් හානිවලින් "පොතෙන් අයින් කිරීමේ නියෝගයක්" ලබාගත යුත්තේ කුමන හානිය සඳහාද?

(1) මෝටර් රථයකට රිය අනතුරක් සිදුවීම.

(2) අධි ගෙවීමක් කිරීම.

(3) රජය භාරයේ තිබූ වත්කමකට අලාභ හානි සිදුවීම.

(4) පරිගණක යන්ත්‍රයක් නැතිවීම. (............)

5. "බැංකු සැසඳුම්" වාර්තාවක ඇමිණිය යුතු ලැයිස්තුවක් වනුයේ,

(1) බැංකු ප්‍රකාශනය

(2) උපලබ්ධි නොවූ චෙක්පත් ලැයිස්තුව

(3) ලැබූ චෙක්පත් ලැයිස්තුව

(4) නිකුත්කළ චෙක්පත් ලැයිස්තුව (............)

www.psc.wp.gov.lk

6.රජයේ කාර්යාලයක් සතුව පවත්නා සේප්පුවල අනු යතුරු ,

(1) ගණන්දීමේ නිලධාරියා වෙත භාර දී තිබිය යුතුය.

(2) ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත භාරදී තිබිය යුතුය.

(3) ගණකාධිකාරී භාරයේ තිබිය යුතුය.

(4) භාණ්ඩාගාරය වෙත භාරදිය යුතුය. (............)

7.රජයේ අයවැය ඇස්තමේන්තුවල ප්‍රතිපාදන වෙන් කිරීමේදී එසේ ප්‍රතිපාදන වෙන්කිරීම සඳහා සංකේත අංක භාවිතා කරනු ලැබේ.පහත සංකේත නිවැරදිව පිළිවෙලින් දක්වන වැකිය කවරේද?

**“240-02-03-1002”**

(1) වැය විෂයය,ශීර්ෂය,වැඩසටහන,ව්‍යාපෘතිය

(2).ශීර්ෂය,වැඩසටහන,ව්‍යාපෘතිය,වැය විෂයය

(3) ශීර්ෂය,වැය විෂයය,ව්‍යාපෘතිය,වැඩසටහන

(4) වැඩසටහන,ව්‍යාපෘතිය,ශීර්ෂය,වැය විෂයය **(............)**

8.රජයේ නිලධාරියෙකු තම රාජකාරී ඉටුකිරීමේදී මහජනයාට සිදුවන කවර හෝ අලාභ හානියක් වෙනුවෙන් අනුකම්පා සහගතව රජයෙන් ගෙවන වන්දි මුදල හඳුන්වනුයේ ,

(1) හානි රක්ෂණ වන්දි ගෙවීම්

(2) වන්දි වශයෙන් ගෙවන කරුණා සහගත ගෙවීම්

(3) හානි පූර්ණ වන්දි ගෙවීම්

(4) අධි ගෙවීම් **(............)**

9.මූල්‍ය පාලන බලතල පැවරීම සමබන්ධ විධිවිධාන අඩංගු මුදල් රෙගුලාසි වගන්තිය වනුයේ,

(1) මු.රෙ.135

(2) මු.රෙ.136

(3) මු.රෙ.237

(4) මු.රෙ.413 **(............)**

10.භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තුවකට හෝ තනි පුද්ගලයෙකුට දෙනු ලබන මුදල් පහත නමින් හැඳින්වේ.

(1) අතුරු අග්‍රිමය

(2) අග්‍රිමය

(3) අඛණ්ඩ අග්‍රිමය

(4) අග්‍රිම අධිකාරී බලය **(............)**

www.psc.wp.gov.lk

11.රජයේ දෙපාර්තමේන්තුවක ලැබීම් හා ගෙවීම් සටහන් කරන,ගිණුම් අංශයේ පවතින මූලික පොත වනුයේ,

(1) වැය ලෙජරය

(2) තැන්පතු ලෙජරය

(3) මුදල් පොත

(4) ආදායම් ලෙජරය (............)

12.ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියේ ලංසු ඇගයීම් කමිටුවක කාර්යභාරය නොවනුයේ,

(1) ප්‍රසම්පාදන ලියවිලි අනුමත කිරීම.

(2) ලංසුකරුවෙකු තෝරාගැනීම පිළිබඳ නිර්දේශ ලබා දීම.

(3) පූර්ව ප්‍රසම්පාදන රැස්වීම්වලට සහභාගී වීම.

(4) ඇනවුම්කර ලබාගත් භාණ්ඩ පිරිවිතරවලට අනුකූලතාවය පිළිබඳ තහවුරු ලබා දීම. (............)

13.වාර්ෂිකව පවත්වන භාණ්ඩ සමීක්ෂණයක මූලික අරමුණක් වනුයේ,

(1) පාවිච්චි කළ නොහැකි භාණ්ඩ පිළිබඳ  වාර්තා කිරීම.

(2) භාණ්ඩ නැතිවී තිබේනම් ඒ පිළිබඳ හඳුනාගැනීම.

(3) ඉන්වෙන්ට්‍රි පොතේ භාණ්ඩ ලැබිම් සහ නිකුත්කිරීම් නිවැරදිව සටහන් කර තිබේද යන්න බැලීම.

(4) වංචාවක් සිදුවී තිබේද යන්න සොයා බැලීම. (............)

14.කාර්යාලයක “සැපයුම් වැඩ හා සේවා” සම්පූර්ණ කළ පසු ඒ පිළිබඳ හිමිකම භාරගැනීමට අවසර දීම හඳුන්වනුයේ,

(1) බලය දීම වශයෙනි.

(2) අනුමත කිරීම වශයෙනි.

(3) සහතික කිරීම වශයෙනි.

(4) ගෙවීම වශයෙනි. (............)

www.psc.wp.gov.lk

15.විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවෙන් සම්මත වූ පසු මුදල් අමාත්‍යවරයා විසින් අත්සන් කරනු ලබන වොරන්ට් බලපත්‍රයක් වනුයේ,

(1) සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය

(2) අධියාචනා වොරන්ට් බලපත්‍රය

(3) විශේෂ වොරන්ට් බලපත්‍රය

(4) පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍රය (............)

16.රජයේ කාර්යාලයක නිලධාරීන් වෙත ප්‍රතිපූරණය කරනු ලබන වියදම් වර්ගයක් වනුයේ,

(1) අතිකාල

(2) වැටුප්

(3) සංග්‍රහ දිමනා

(4) සංයුක්ත දීමනා (............)

17."අධිභාරයක්" යන කරුණ පිළිබඳ වඩාත් නිවැරදි වැකිය වනුයේ,

(1) රජයේ සේවකයෙකුට වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු අය කර ගැනිමකි.

(2) රජයේ සේවකයෙකු රජයට සිදුකරන ලද ඔහු විසින් වගකිව යුතු කිසියම් පාඩුවක් පූර්ණය කරවා ගැනීමකි.

(3) රජයේ සේවකයෙකුට නියම කරනු ලබන දණ්ඩනයක් නොවේ.

(4) ඉහත කරුණු තුනම නිවැරදි වේ. (............)

18.ගොඩනැගිල්ලක් සෑදීම සඳහා දෙපාර්තමේන්තුවක් විසින් ඇස්තමේන්තුවක් පිළියෙල කර ඇති අතර,එහි ඇස්තමේන්තුගත අගය රු.මි.187කි.ඒ අනුව මෙම කාර්යය පිලිබඳ ප්‍රසම්පාදන කටයුතු කළ යුතු ප්‍රසම්පාදන කමිටුව වනුයේ,

(1) අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව

(2) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව

(3) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

(4) ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව (............)

www.psc.wp.gov.lk

19. 2019 වර්ෂයේ ගෙවිය යුතු වියදමක් 2022 වර්ෂයේදී ගෙවීම සඳහා

(1) මු.රෙ.115 ප්‍රකාර අනුමැතියක් අවශ්‍ය නොවේ.

(2) මු.රෙ.115 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය අවශ්‍ය වේ.

(3) මු.රෙ.115 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය අවශ්‍ය වේ.

(4) භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය අවශ්‍ය වේ. **(............)**

20.රජයේ ඇස්තමේන්තුවල වියදම්,පුනරාවර්තන සහ ප්‍රාග්ධන වශයෙන් වර්ග කෙරේ.පුනරාවර්තන වියදමකට උදාහරණයක් නොවනුයේ,

(1) දේපළ අළුත්වැඩියා වියදම්

(2) දේපළ පුනරුත්තාපන වියදම්

(3) යන්ත්‍ර නඩත්තු වියදම්

(4) ඉන්ධන වියදම් **(............)**

www.psc.wp.gov.lk

21.යම් දෙපාර්තමේන්තුවක "බීජ මිලදී ගෙන අලෙවි කිරීම" සඳහා අත්තිකාරම් ගිණුමක් පවතී නම්,එම අත්තිකාරම් ගිණුම,

(1) වාණිජ අත්තිකාරම් ගිණුමකි.

(2) නිෂ්පාදන අත්තිකාරම් ගිණුමකි.

(3) ගබඩා අත්තිකාරම් ගිණුමකි.

(4) සංවර්ධන අත්තිකාරම් ගිණුමකි. **(............)**

22.ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන "විශේෂ නීති සේවා" යටතේ වියදම් දැරීම සඳහා

(1) වාර්ෂිකව විසර්ජන පනත මගින් අනුමැතිය ලැබේ.

(2) වාර්ෂිකව පාර්ලිමේන්තු අනුමැතියක් ලබා ගැනීම අවශ්‍ය නොවේ.

(3) වාර්ෂිකව ජනාධිපතිවරයාගේ අනුමැතිය ලබාගත යුතුය.

(4) වාර්ෂිකව මුදල් ඇමතිවරයාගෙන් අනුමැතිය ලබාගත යුතුය. **(............)**

23.වීරමොං ක්‍රියා පටිපාටියට අදාළ පහත වැකි හතරෙන් නිවැරදි නොවන වැකිය කවරේද?

(1) ව්‍යාපෘති දෙකක් අතරතුර පුනරාවර්තන ප්‍රතිපාදන මාරු කළ හැක.

(2) ප්‍රාග්ධන ප්‍රතිපාදන වුවද මාරු කළ හැක.

(3) ශීර්ෂ දෙකක් අතර ප්‍රතිපාදන මාරු කළ හැක.

(4) ප්‍රතිපාදන මාරුකිරීම ගණන්දීමේ නිලධාරියෙකුට අනුමත කළ හැක. (............)

24.රාජ්‍ය ගිණුම් කටයුතු පිළිබඳ කාරක සභාව සිය වාර්තා ඉදිරිපත් කරනුයේ,

(1) පාර්ලිමේන්තුව වෙතය.

(2) ජනාධිපතිවරයා වෙතය.

(3) මුදල් අමාත්‍යවරයා වෙතය.

(4) භාණ්ඩාගාරය වෙතය. (............)

25.ආදායම් සම්බන්ධ මූල්‍ය පාලන කාර්යයන් පවරාදීමේදී "එකතුකිරීම" යනු

(1) රජයට ලැබිය යුතු ආදායම අයකර ගත යුතු පුද්ගලයින් කවුරුන්ද යන්න නිශ්චය කිරීම වේ.

(2) එකතු කරගන්නා මුදල් ගිණුම්ගත කිරීම වේ.

(3) රජයට ලැබිය යුතු මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලිය වේ.

(4) රජයට අයකර ගන්නා මුදල් ආරක්ෂා කර ගැනීම වේ. (............)

www.psc.wp.gov.lk